**Principal:** *Nicky Walker*
**Assistant Principal:** *Anne McDonald*
**Assistant Principal:** *Kerry Bates*
**Assistant Principal:** *Mick Sweeney*
**Business Manager:** *Nicholas Macura*

## 19.5.2020

# CCPS COVID-19 පාසලට නැවත පැමිණීම සඳහාවන මාර්ගෝපදේශය

## පාසල් සෞඛ්‍ය සහ ආරක්ෂක පියවර

- වර්ග මීටර හතරකට එක් පුද්ගලයෙකුට වඩා නොඉක්විය යුතිය යන සහ පන්ති කාමර ක්‍රියාකාරකම් වලදී සිසුන් අතර මීටර් 1.5 ක් පවත්වා ගෙන යා යුතිය යන 'ස්ථාන සනත්ව රීතියක්' පන්ති කාමරවල හෝ කොරිඩෝවල සුදුසු හෝ ප්‍රායෝගික නොවන බව ඕස්ට්‍රේලියානු සෞඛ්‍ය ආරක්ෂණ විදුහල්පති කමිටුව (ඒඑච්පීපීසී) උපදෙස් දී ඇත.

- එබැවින්, කලින් ස්ථාපිත කරන ලද පන්තියකට සිසුන් 10 දෙනෙකුගේ අනුපාතය තවදුරටත් පාසල්වල අවශ්‍ය නොවේ.

- **2020 මැයි 25 වන සඳුදා** සංක්‍රාන්තිය සඳහා සූදානම් වීමට සියලුම පාසල් කාර්ය මණ්ඩලයට සහාය වීම **ශිෂ්‍යයන් නොසිටින දිනයක් වනු ඇත.**මෙම දිනය තුළ තම පාසලේ සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම සහතික කිරීම, පාසල් චර්යාවන් නැවත ස්ථාපිත කිරීම, දුරස්ථ හා නම්‍යශීලී ඉගෙනුම් කාල සීමාව තුළ සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රවේශයක් ස්ථාපිත කිරීම සහ ක්ෂණික සෞඛ්‍ය සහ සුබසාදන අවශ්‍ය සිසුන් හඳුනා ගැනීම සඳහා මෙම දිනය භාවිතා කෙරෙනු ඇත.

- සිසුන්ට නැවත පැමිණීමට සහාය වීම, තත්ත්වය පිළිගැනීම, සිදුවෙමින් පවතින දේ පිළිබඳව සංවර්ධනාත්මකව සුදුසු තොරතුරු සැපයීම මෙන්ම සිසුන්ට ඔවුන්ගේ ගැටළු සහ හැඟීම් මතු කිරීමට ආරක්ෂිත ඉඩකඩ ලබා දීමේ වැදගත්කම අපි අගය කරමු.

පාසල් ස්ථානීය අධ්‍යාපනය සඳහා නැවත පැමිණෙන පංති මට්ටම්වල සිටින සියලුම සිසුන් පාසලට පැමිණීමට අපේක්ෂා කෙරේ. වෛද්‍ය උපදෙස් මත හැර මෙම සිසුන් නිවසේ තබා ගැනීමට දෙමාපියන් තීරණය කරනවිට දුරස්ථ ඉගෙනුම් ලබාදීමට පාසල් අපේක්ෂා නොකෙරේ. එසේ නම් කරුණාකර ඔබේ උප පාසල් සහකාර විදුහල්පති අමතන්න.
ෆවුන්ඩේෂන් - 2 ශ්‍රේණිය: ඈන් මැක්ඩොනල්ඩ්
3 ශ්‍රේණිය සිට 6 ශ්‍රේණිය දක්වා: මික් ස්වීනි
සුබසාදන: කෙරී බේට්ස්

## වෙනත් සෞඛ්‍ය සහ ආරක්ෂක පියවර

- ක්‍රීඩා උපකරණ භාවිතා කළ හැකිය. කෙසේ වෙතත්, සිසුන් ඒවා භාවිතයට පෙර සහ පසු අත් සේදිය යුතුය. වැඩිදියුණු කරන ලද පිරිසිදු කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස රෝහල් ශ්‍රේණියේ විෂබීජ නාශකයක් යොදා කුඩා විවේක කාලය තුල සහ දිවා ආහාරයෙන් පසු ක්‍රීඩා පිටි පිරිසිදු කරනු ලැබේ.

- හුවමාරු කළ හැකි උපකරණ භාවිතා කරන්නේ නම්, භාවිතයට පෙර සහ පසු දැඩි අත් සනීපාරක්ෂාව අනුගමනය කරනු ලැබේ.

- සිසුන්ට ළිංවලින් සෘජුවම පානීය ජලය ලබාගෙන පානය කිරීමට නොහැකි බැවින් පාසැලේ භාවිතා කිරීම සඳහා තමන්ගේම වතුර බෝතලයක් රැගෙන යේම අවශ්‍යවේ.

- DET සිසුන් ජංගම දුරකථන භාවිතා කිරීමේ ප්‍රතිපත්තියක් ඇත. සෑම උදෑසනකම එම ජංගම දුරකථන කාර්යාලයට භාර දෙන විට විෂබීජහරණය කිරීමෙන් අනතුරුව භාරදෙන ලෙස සිසුන්ට දැනුම් දෙනු ලැබේ. COVID SAFE යෙදුම



*15 Silky Oak Drive*
*Cranbourne, 3977*
*Phone: 5991 3600*
Email: cranbourne.carlisle.ps@edumail.vic.gov.au
Website: http://www.cranbournecarlisleps.vic.edu.au

පාසලට පෙර සහ පසු වහාම ක්‍රියාත්මක කිරීමෙන් දුරකථන සක්‍රිය කළ හැකිය. පාසල් යනු කළමනාකරණ පරිසරයන් වන අතර ඒවාට ශිෂ්‍ය, කාර්ය මණ්ඩලය සහ නරඹන්නන්ගේ පැමිණීම ඇතුළත් වේ.

## මානසික සෞඛ්‍යය සහ සුබසාදන

ඔබේ දරුවාගේ මානසික සෞඛ්‍යය හා යහපැවැත්ම පිළිබඳව ඔබට විශේෂ සැලකිල්ලක් තිබේ නම් අපට පවතින ඕනෑම සේවාවක් සහ ආධාරකයක් වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම සඳහා කරුණාකර හැකි ඉක්මනින් සහකාර විදුහල්පතිවරුන්ට දන්වන්න.

ෆවුන්ඩේෂන් - 2 ශ්‍රේණිය: ඈන් මැක්ඩොනල්ඩ්
3 ශ්‍රේණිය සිට 6 ශ්‍රේණිය දක්වා: මික් ස්වීනි
සුබසාදන: කෙරී බේට්ස්

## පිරිසිදු කිරීම

දීර්ග කරන ලද හා වැඩි කරන ලද පිරිසිදු කිරීමේ විධිවිධාන හඳුන්වා දී ඇති අතර එය දිගටම පවත්වා ගෙන යනු ලැබේ මෙය අධික ලෙස ස්පර්ශය කරනු ලබන ස්ථානවල සම්ප්‍රේෂණය වීමේ අවදානම අඩු කිරීම සහතික කිරීම පිණිස දවස පුරා අඛණ්ඩව පිරිසිදු කිරීමේ ක්‍රියාවෙලිය හා සම්බන්ධ වේ.

## ස්ථානය වෙත පැමිණීම

කොරොනා වයිරස් (COVID-19) සම්ප්‍රේෂණය වීමේ අවදානම අවම කිරීම සඳහා පාසල් ප්‍රජාවන්ට ගත හැකි වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ, ඕනෑම අසනීප කාර්ය මණ්ඩලයක්, ළමුන් සහ තරුණයින් නිවසේ රැඳී සිටීම සහතික කිරීමයි. වෛරසය සම්ප්‍රේෂණය වීමේ අවදානම ඉතා අඩු වුවද, දරුණු රෝගාබාධවලට ගොදුරු වීමේ අවදානමක සිටින කාර්ය මණ්ඩලය හෝ සිසුන් මෙම අවස්ථාවේ දී ඔවුන්ගේ වෛද්‍ය වෘත්තිකයාගේ සහාය ඇතිව ස්ථානය වෙත පැමිණීම සඳහා යෝග්‍යතාවය තක්සේරු කළ යුතුය.

පාසල් පරිසරය තුළ කොරෝනා වයිරස් (COVID-19) සම්ප්‍රේෂණය වීමේ ප්‍රධාන අවදානම වැඩිහිටියන් අතර ඇති හෙයින්, පාසල් භූමියට පැමිණෙන අමුත්තන් අත්‍යවශ්‍ය පාසල් සේවා සහ මෙහෙයුම් ලබා දෙන හෝ සහාය දක්වන අයට පමණක් සීමා වේ. කිසියම් හේතුවක් නිසා දෙමාපියන්ට පාසල හා සම්බන්ධ වීමට අවශ්‍ය නම් කරුණාකර පාසල් කාර්යාලයට කතා කරන්න.

**සියලුම අසනීප කාර්ය මණ්ඩලය සහ සිසුන් නිවසේ සිටිය යුතුය.**

සංකූලතා සහිත වෛද්‍ය අවශ්‍යතා ඇති සිසුන්ගේ දෙමාපියන් / රැකබලා ගන්නන් (ප්‍රතිශක්තිකරණ අඩු අය ඇතුළුව), ස්ථානයේ සිට අධ්‍යාපනය ලබාගැනීම සුදුසු ද යන්න පිළිබඳව තීරණ ගැනීමට සහාය වීම සඳහා ශිෂ්‍ය වෛද්‍යවරයාගෙන් උපදෙස් ලබා ගත යුතු අතර, මෙම උපදෙස් තත්ත්වය වික්ටෝරියා හි කොරොනා වයිරස් (COVID-19) වසංගතය අනුව වෙනස් විය හැකි බව සඳහන් වේ. මෙය DET (DET Health Care Needs) සෞඛ්‍ය ආරක්ෂණ අවශ්‍යතා ප්‍රතිපත්තියට අනුකූල වේ. මෙම ප්‍රදේශයේ අමතර අවශ්‍යතා ඇති ඕනෑම පවුලකට පාසල සහාය වනු ඇත.

පාසල් එක්රැස්වීම්, විනෝද චාරිකා, කඳවුරු සහ අත්‍යවශ්‍ය නොවන විශාල රැස්වීම් නැවත දැනුම් දෙන තුරු කල් දමනු ලැබේ.



*15 Silky Oak Drive*
*Cranbourne, 3977*
*Phone: 5991 3600*
Email: cranbourne.carlisle.ps@edumail.vic.gov.au
*Website:* http://www.cranbournecarlisleps.vic.edu.au

## සනීපාරක්ෂාව

ඵලදායී අත් සනීපාරක්ෂාව අඛණ්ඩව පවත්වා ගැනීමෙන් සෑම කෙනෙකුටම තමන්වම ආරක්ෂා කර ගත හැකි අතර කොරොනා වයිරස් (COVID-19) පැතිරීම වළක්වා ගත හැකිය. ස්ථානීය ඉගැන්වීම් සහ ඉගෙනීම් වෙත ආපසු යාමේදී වැඩි දියුණු කළ සනීපාරක්ෂක පියවරයන් අඛණ්ඩව පවතිනු ඇත.

- සියළුම කාර්ය මණ්ඩලය සහ සිසුන් නිතිපතා අත් සනීපාරක්ෂාව අනුගමනය කළයුතු අතර විශේෂයෙන් පාසලට පැමිණෙන විට, කෑමට පෙර සහ පසු, නාසයෙන් සෙම බැහැරකිරීම , කැස්ස, කිවිසුම් හෝ වැසිකිළිය භාවිතා කිරීම වැනි ක්රියාවලියෙන් පසුව අත් සනීපාරක්ෂාව අනුගමනය කළයුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී කාර්ය මණ්ඩලය විසින් මෙය මෙහෙයවනු ලැබේ හෝ අධීක්ෂණය කරනු ලැබේ.
- සබන් හා ජලය පහසුවෙන් ලබා ගත නොහැකි අවස්ථාවල, සෑම කාමරයකම අත් සනීපාරක්ෂක විශබීජහරන ද්‍රව්‍ය තිබේ.
- මෙම අවස්ථාවේදී සිසුන්ට ඍජුවම ළිං ජලය පානය කිරීමට අවසර නොලැබේ. ඒ වෙනුවට ඔවුන් පාසැලේ භාවිතය සඳහා (සහ නැවත පිරවීම) තමන්ගේම වතුර බෝතලයක් ගෙන ආ යුතුය.

## පාසැලට පැමිණීම සහ පිටවීම

පාසල් පරිසරයට කොරොනා වයිරස් (COVID-19) හඳුන්වා දීමේ ප්‍රධාන අවදානම වැඩිහිටියන්ගෙන් වන බැවින්, විශේෂයෙන් පාසල් වෙත ළමුන් රැගෙන එනවිට හා රැගෙන යනවිට පාසල් ප්‍රජාවේ වැඩිහිටි සාමාජිකයන් අතර සමීප සම්බන්ධතාවයක් වළක්වා ගත යුතුය.

- කාර්ය මණ්ඩලය සහ දෙමව්පියන් පාසල තුළ හෝ අවට ප්‍රදේශවල රැස් නොවී ශාරීරික දුරස්ථ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.
- පාසල තුළ සහ පාසල් පිවිසුම් ස්ථානවලදී ශාරීරික දුරස්ථභාවය හා සිසුන් හා වැඩිහිටියන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය අවම කිරීම සඳහා වන විධිවිධානයන්ට පහත සඳහන් කරුණු ඇතුළත් වේ:
  - වැඩිහිටියන් අතර පරතරය දිරිගැන්වීම සඳහා පාසල් ගේට්ටුව අසල ස්ථානීය සලකුණු කිරීම
  - දෙමව්පියන්ට පාසල් පරිසරය තුළ සිටීමට අවසර නොමැති අතර අවශ්‍ය පරිදි දුරකථනයෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් පාසල හා සම්බන්ධ වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.
  - අත්‍යවශ්‍ය රැස්වීම් වීඩියෝ සම්මන්ත්‍රණ හරහා පැවැත්වේ
  - ඕනෑම අන්තර්ක්‍රියාකාරිත්වයක් සමාජ දුරස්ථ මාර්ගෝපදේශය අනුව විය යුතු අතර සුබපැතීම් ද ශාරීරික ස්පර්යෙන් තොරව සිදුවිය යුතුය.
  - පාසල් ගේට්ටුවේ හෝ පන්ති කාමරවලින් පිටත රැස්වන වැඩිහිටියන්ගේ සංඛ්‍යාව අඩු කිරීමට වැඩිහිටියන් එකතැන රොක්වෙමින් ළමුන් රැගෙන යාමේ සහ ඊමේ වේලාවන් අවම කිරීමට ක්‍රියානරනු ඇත.



*15 Silky Oak Drive*
*Cranbourne, 3977*
*Phone: 5991 3600*
Email: cranbourne.carlisle.ps@edumail.vic.gov.au
*Website:* http://www.cranbournecarlisleps.vic.edu.au